වහාම ප්‍රකාශයට පත්කිරීම පිණිසයි

# සවුදි අරාබිය: ගෘහ සේවිකාවට මරණීය දන්ඩනය පැණවීම නතරකරනු

***ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවගේ මරණ දඬුවම ස්ථිර කෙරේ, චෝදනාව එල්ලවී ඇති මරණය සිදුවන අවස්ථාවේ ඇයට අවුරුදු 17කි***

(නිව්යෝක්, 2010 ඔක්තෝබර් 26)- දාහත් හැවිරිදි වියේදී තම භාරයේ සිටි ළදරුවෙකු ඝාතනය කිරීමේ චෝදනාවට වැරදිකාරිය බව තීන්දුවී සිටින ශ්‍රී ලාංකික ගෘහ සේවිකාව රිසානා නෆීක් මරණ දඬුවමෙන් බේරාගැනීමට අබ්දුල්ලා රජතුමා සහ නයිෆ් කුමරු කටයුතු කලයුතු බව හියුමන් රයිට්ස් වොච් සංවිධානය අද ප්‍රකාශකලේය. බාලවියේදී සිදුකරන ලද වරදක් සම්බන්ධයෙන් පසුගිය වසර දෙක ඇතුලත කිසියම් හෝ පුද්ගලයෙකුට මරණ දඬුවම ක්‍රියාත්මක කරන ලද බව වාර්තාවන රටවල් තුනෙන් සවුදි අරාබිය එක් රටකි.

2005 මැයි මාසයේදී තම භාරයේ සිටි උටයිබි පවුලේ සිවුමස් හැවිරිදි ළදරුවා මරණයට පත්වනවිට රිසානා නෆීක් සවුදි අරාබියේ සේවයට පැමිණ ගතවී තිබුනේ සති දෙකක් පමණි. රැකියාවක් සඳහා විදේශගතවීමට අවස්ථාව සලසාගැනීම පිණිස ඇයට ඒ' වනවිට වයස අවුරුදු 23ක් බව පෙන්වීම සඳහා ශ්‍රී ලංකාවේ රැකියා ඒ'ජන්සියක් ඇගේ ගමන් බලපත්‍රයේ උපන්දිනය වෙනස්කර තිබූ නමුත් සැබවින්ම  ඒ' වනවිට ඇගේ වයස අවුරුදු 17ක් පමණක් බව ඇගේ උප්පැන්න සහතිකය මගින් තහවුරු කෙරුනි.

"එම සිදුවීම් හටගත්තේ නෆීක් කුඩා දැරියකව සිටි අවදියේ බවට මතභේදයක් නැතැයි," හියුමන් රයිට්ස් වොට්ච් සංවිධානයේ කාන්තා අයිතිවාසිකම් පිලිබඳ ජ්‍යෙෂ්ඨ පර්යේෂිකාව නිශා වාරියා පැවසීය. "සවුදි ආණ්ඩුව එක් ඛේදවාචකයකට පසුව තවත් ඛේදවාචකයත් ඇතිවීමට ඉඩදිය යුතු නැත. ලාබාල වියේදී කරන ලදැයි චෝදනා එල්ලවන වරදක් සඳහා තවමත් මරණ දඬුවම ක්‍රියාත්මක කරන ලොව රටවල් අතලොස්ස අතරින් එකක් බවට තිබෙන කුප්‍රකට තත්ත්වයෙන් මිදීමට සවුදි අරාබියට කාලය එලැඹ තිබේ."

නෆීක් පිලිබඳ තීන්දුව සහ මරණ දඬුවම සවුදි අරාබියේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්ථිර කොට ඇතිබව පසුගිය සතියේ තමන්ට දැනගන්නට ලැබිනැයි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිළධාරියෙක් හියුමන් රයිට්ස් වොච් සංවිධානයට පැවසීය. මේ වසරේ ඔක්තෝබර් 24 වැනිදා ඇය මුණගැසීමට ගිය සමාජ සේවිකාවක් හියුමන් රයිට්ස් වොච් සංවිධානයට කියාසිටියේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අලුත්ම තීන්දුව පිලිබඳව නෆීක් තවමත් නොදන්නා අතර, ඇය ගෙදර යන්නේ කවදාදැයි නො ඉවසිල්ලෙන් බලාසිටින බවයි.

නෆීක්ට නීතිවේදීන් මුණගැසීම සඳහා ප්‍රමාණවත් අවස්ථා ලැබුනේද යන්න සහ ඇගෙන් ප්‍රශ්ණකල අවස්ථාවේ හා නඩු විභාගය අතරතුර නිසි පරිවර්තකයෙකු ලැබුනේද යන්න පිලිබඳව හියුමන් රයිට්ස් වොච් සංවිධානය කලින් කරන ලද සම්මුඛ සාකච්ඡාවලදී සහ අරාබි නිව්ස් පුවත්පත විසින්ද අවධානය පලකරන ලදි. ඇය අත්අඩංගුවට ගනු ලැබුනේ 2005දී වුවත්, දවාද්මිහි අධිකරණයක් විසින් 2007දී මරණ දඬුවම පණවන තුරුම ඇයට නීතිවේදියෙකුගේ සහාය ලැබී තිබුනේ නැත. දැඩි පීඩනයක් යටතේ සිදුකරන ලද බව ඇය පවසන පාපොච්චාරණය ඇය විසින් පසුව වෙනස් කරන ලද අතර, බෝතලයකින් වතුර බොන අවස්ථාවේ වතුර උගුරේ සිරවීමෙන් එම ළදරුවා මියගිය බව ඇය පවසයි.

අධිකරණය තම තීන්දුවට එලැඹීමේදී ඉස්ලාමීය නීතිය වැරදි ලෙස අර්ථදක්වා ඇතිබව හෝ අලුත් සාක්ෂි ඉදිරිපත්කලහැකිනම් හැර, ශ්‍රේෂ්ඨාධිකරණයේ අලුත්ම තීන්දුවත් සමගින් ඇය නිදහස් කරගැනීමේ සියලු අධිකරණ ක්‍රියාමාර්ග අවසන්වී තිබේ. කෙසේවුවද රජතුමා සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමේ නියෝගයට අත්සන් තැබිය යුතු අතර, එම අනුමැතියෙන් තොරව කිසිවෙකු මරණීය දණ්ඩණයට ලක්නොකෙරේ. තමන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් හමුවීම සඳහා වේලාවක් ඉල්ලා තිබෙන බව ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙක් හියුමන් රයිට්ස් වොච් සංවිධානයට පැවසීය.

මිනීමැරුම් සම්බන්ධ සවුදි අරාබියේ පිලිගත් ක්‍රියාපිලිවෙතට (කීසා) අනුව, වන්දි වශයෙන් මුදලක් ඉල්ලා සිටීමට හෝ නෆීක්ට මරණ දණ්ඩණය පැණවීමට රාජ්‍යයට අවස්ථාව සලසනු වෙනුවට ඇයට සමාවක් ප්‍රදානය කිරීමටද මියගිය ළදරුවාගේ දෙමාපියන්ට හැකියාව තිබේ.

"මෙම මරණ ඩඬුවම වෙනස් කිරීමේ උත්සාහයක් වශයෙන් සවුදි ආණ්ඩුව උටයිබි පවුලේ සාමාජිකයන්, ශ්‍රී ලංකා බළධාරීන් සහ අනෙක් සියලුම පාර්ශවයන් මුණගැසී උපරිම උත්සාහයක් දැරිය යුතු බව," වාරියා පැවසීය.

වයස අවුරුදු 18 සපිරීමට පෙර සිදුකරන ලද වැරදි සම්බන්ධයෙන් මරණ දඬුවම හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් පැනවීම සපුරා තහනම් කෙරෙන ළමා අයිතිවාසිකම් පිලිබඳ ප්‍රඥප්තියට (CRC) සවුදි අරාබිය අත්සන් තබා තිබේ. කෙසේවුවද, අපරාධ සම්බන්ධ

නඩු විභාගවලදී දරුවන් වැඩිහිටියන් ලෙස සැලකීමට සවුදි නීතියෙන් විනිශ්චයකරුවන්ට බලය පවරාදී තිබෙන අතර, අවුරුදු 13 තරම් බාල වියේ දරුවන්ට අධිකරණයෙන් මරණ දඬුවම පණවා තිබේ.

මරණ දඬුවම කුරිරු දඬුවමක් ලෙසින් සලකන හියුමන් රයිට්ස් වොච් සංවිධානය ඕනෑම අවස්ථාවක එම දඬුවම පැණවීමට විරොධය පලකරයි. 2009 වසරේදී පමණක් සවුදි අරාබිය විසින් 53 දෙනෙකු මරණීය දණ්ඩණයට ලක්කරන ලද අතර, ළමා වියේදී කරන ලද බව පැවසෙන වැරදි සම්බන්ධයෙන් දඬුවම් ලැබුවන් තිදෙනෙකුද එ' අතර විය.

සවුදි අරාබිය, බාලවියේ දරුවන්ට මරණ දඬුවම පැණවීම හෝ සංක්‍රමණික ගෘහ සේවිකාවන් පිලිබඳ හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ අතිරේක වාර්තා සඳහා කරුණාකර අපේ වෙබ් අඩවියට පිවිසෙන්නඃ

**රිසානා නෆීක්ගේ සිද්ධියට අදාල හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ වැඩිදුර වාර්තා සඳහා කරුණාකර පිවිසෙන්නඃ**

http://www.hrw.org/en/news/2007/07/29/saudi-arabia-fair-appeal-domestic-worker-death-row

වැඩි විස්තර සඳහා කරුණාකර පහත දැක්වෙන අය අමතන්න:

නිව්යෝක් නුවරදී, නිශා වාරියා (ඉංග්‍රීසි) +1-212-216-1858; +1-917-617-1041 (ජංගම දුරකථනය) හෝ varian@hrw.org

මියුනිච් නුවරදී, ක්‍රිස්ටොෆ් විල්කෙ (ඉංග්‍රීසි, අරාබි, ජර්මන්) +49-89-1392-6193 (කාර්යාලය) හෝ wilckec@hrw.org